# 2.24 උඩුගම්පොළ උපරාජධානිය පිළිබඳ පුරාවිද්‍යාත්මක සහ මානවවිද්‍යාත්මක අධ්‍යයනයක්

එම්. ඩබ්. ඒ. ඩී. එන්. විජේසූරිය
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

---

## ABSTRACT

රාජධානි අනුක්‍රමික රටාව තුළ අනුරාධපුර, පොළොන්නරු ආදී ප්‍රධාන රාජධානි සඳහා ප්‍රමුඛස්ථානයක් හිමි වන අතර වැඩි අවධානයක් යොමු වන්නේ ද එම රාජධානිවලට ය. එහෙත් රාජධානි අනුක්‍රමික රටාවේ ප්‍රධාන රාජධානිවලට සමගාමීව පැවති උප රාජධානි පිළිබඳව දැනුවත් භාවය ද අඩු අගයක් ගනියි. ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොළ උපරාජධානිය එවැන්නකි. පැරණි කෝට්ටේ රාජධානියේ රජකම් කළ අට වන වීර පරාක්‍රමබාහු රජුගේ පුත්‍රයකු වූ සකලකලාවල්ලකබාහු රජු මෙම රාජධානියේ පාලනය ගෙන ගොස් ඇති බවට මූලාශ්‍රමය සාදක ද විද්‍යමානව පැවතීම විශේෂිතය. අතීතයේ එම රජුගේ මාළිගාව පිහිටි ස්ථානයේ උත්තරාරාම පුරාණ රජමහා විහාරය ඉදිකර ඇත. තව ද රාජධානී ව්‍යුහය හා බැඳී පැවති ශේෂිත සාදක අතර රජු දිය නෑ පොකුණ, ආරක්සිත දිය අගල තවමත් ජීවමාන සාධක වෙයි. එහෙත් මෙතරම් ඓතිහාසික සාධක රැසකින් සමන්විත වුව ද කිසිවෙකුගේත් අවධානයට ලක්නොවී දිනෙන් දින මෙම රාජධානියේ ශේෂිත සාධක විනාශ වෙමින් පවති. මේ රාජධානියේ ඓතිහාසික පසුබිම කෙසේ වී ද එහි ශේෂිත සාධක කවරේද මෙම උරුමය විනාශ වන අකාරය කෙසේ වී ද යන්න පිළිබඳව පූර්ණ තොරතුරු ගෙන හැර දක්වීම මෙම පත්‍රිකාව ඉදිරිපත් කිරිමේ ප්‍රධාන අරමුණයි.